කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

# සිංහල

## පුරාතන සිංහල සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය- SINH 18224

පළමුවන කොටසත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## I කොටස

01. අ) පහත දැක්වෙන උද්ධෘතයේ අර්ථය ලිහිල් බසින් ලියා, එහි අවස්ථා සම්බන්ධය පැහැදිලි කරන්න.

අනික් කෙළෙඹි කුලයෙහි දියණි කෙනෙක් වූහ. ඒ කුමාරිකාව බෝධිසත්ත්වයන්ගේ බෑණන්ට සරණ ගෙන්වූ ය. බෝධිසත්ත්වයෝ වෙන ගෙයක් දොරක් නැති ව බෑණන්ගේ ගෙයි ම වාසය කෙරෙති. ඉක්බිති එක් දවසෙක අතිරස කැවුම් පිස කිසි කටයුත්තක් නිසා වල ගිය බෝධිසත්ත්වයන්ට තිබා තුමූ දෙදෙන අනුභව කළහ.

එවේලෙහි සිඟා වැඩි පසේ බුදු කෙනෙකුන් වහන්සේ දැක බෝධිසත්ත්වයන්ගේ බැදෑණියෝ උන්ට කැවුම් පසුව පිස දිය හැක්කැයි සිතා බෝධිසත්ත්වයන්ට තිබූ කොටස ඈ පිළිගැන්වූවාය. බෝධිසත්ත්වයෝ "තොපසන්තක කොටස කාපියා මාගේ කොටස දන් දෙන්ට කාරණා කිම් දෑ" යි කිපී ලුහුබඳවා ගොසින් පසේ බුදුන් වහන්සේගේ පාත්‍රයේ තුබූ කැවුම් ඇරගත්තා හ. එකල ස්ත්‍රී මෑණියන්ගේ ගෙට ගොස් සපුමල් පෙත්තක් සේ සත රන්වන් වූ අලුත දැවූ ගිතෙල් ගෙන පාත්‍රයෙහි පුරා සතුටු ව "ස්වාමීනි, මා උපනූපන් ජාතියෙහි මාගේ ශරීරයෙන් ආලෝක පැතිරේවයි, උතුම් වූ රූ ඇති වෙම්වයි, අසත්පුරුෂයා හා එක තෙන වාසය නොකෙරෙම්ව" යි කියා කළ ප්‍රාර්ථනා වශයෙන් ප්‍රභාවතී බෝධිසත්ත්වයන් නොකැමතිවූ ය.

බෝධිසත්ත්වයෝ ද පසේ බුදුන් වහන්සේගේ පාත්‍රයට කැවුම් කොටස පිළිගන්වා "ස්වාමීනි, ඉදින් යොදුන් සියයක උනත් මුන් මාගේ බලයෙන් ගෙන්වා ගෙන මට පාද පරිචාරිකා කරන්ට සමර්ථ වෙම්ව" යි ප්‍රාර්ථනා කෙළෝ ය.

(ලකුණු 12 (8 + 4)

ආ) පහත දැක්වෙන පද්‍යයන්හි අර්ථය ලිහිල් බසින් ලියා ඉතා සංක්ෂිප්ත ඇගයීමක් කරන්න.

සත් තත් සිහින් ගෙදි සෙවණලු වැලි තෙලෙන
තැන් තැන් වල මැ සැතපී සියුමැලි බැවින
රත් වන් කරල් ගෙන එන ගිරවුන් අතින
යත් මත් තොසින් මඟ තොරතුරු නියම දැන

නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරින
දූල කැර සේසත් මිණි බරණ කිරණින
බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන

අග පිපි මල් මලිගිය ලිය කැලේයා
වග බැඳ හෙන රජහස පුල් විලේයා
ළඟ තුරු මල් ගිලිහුණු රොනවුලේයා
මඟ බැස යව පළ හෙළ වැලි තෙලේයා

අයිරාවණ වුවත් නවතින රිසින් එන
අයිරා දහස් දිළි දුනු කොත් සිපත් ගෙන
කයිකාවලෙහි දැක සෙබළුන් රැක සිටින
වයි යා කරන් මල් තුරු ගන වන හිසින

(ලකුණු 12 (8 + 4)

## II කොටස

02. ජාතකකථා වඩාත් ජනප්‍රිය වී ඇත්තේ, විවිධ චරිත විනිවිද දැකීමට ජාතකකථාකරු දැක්වූ සුවිශේෂ සාමර්ථ්‍යය නිසාය. උදාහරණ දක්වමින් විමසන්න.

03. සැළලිහිණියේ ස්වභාව සෞන්දර්ය වර්ණනාවලින් පිළිබිඹු වන රහල් හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය නිදර්ශනාශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

04. කුරුණෑගල යුගයේ ගද්‍ය සාහිත්‍යයෙන් පිළිබිඹු වන විශේෂ ප්‍රවණතා මොනවාදැයි සනිදර්ශනව සාකච්ඡා කරන්න.

05. ගම්පොළ යුගය වනාහි ගද්‍ය හා පද්‍ය ප්‍රභේදද්වයෙහිම සමගාමී භාවයක් පෙන්නුම් කරන යුගයකි. විමර්ශනය කරන්න.

නැතහොත්

කෝට්ටේ යුගයේ දී බිහි වූ පද්‍ය සාහිත්‍ය කෘති පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් කරන්න.

## III කොටස

06. 'භාෂාව වූකලී මිනිසා විසින් නිපදවාගනු ලැබූ අසිරිමත් මෙවලමකි.' නිර්වචන කෙරෙහි සාවධාන වෙමින් විමසන්න.

07. උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ ක්‍රියාකාරිත්වය පහදමින්, භාෂණ සිංහලයේ ශබ්ද මාලාව විභාග කොට දක්වන්න.

නැතහොත්

භාෂාමය සෘණීකරණය නිසා සිංහල භාෂාද්විරූපතාව වඩාත් සංකීර්ණ වී ඇති අයුරු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

08. 'උපභාෂා' යන්න හඳුන්වා, ඒවා බිහිවීමෙහි ලා භූගෝලීය හා ජනසංක්‍රමණ සාධක හේතුවන්නේ කෙසේදැ යි විස්තර කරන්න.

09. භාෂාව වනාහි සංස්කෘතියේ නිරූපණයකි. නිදසුන් දෙමින් පහදන්න.

නැතහොත්

භාෂාව හා සමාජය අතර පවත්නා සබඳතාව පිළිබඳ විමසීමක් කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට සටහන් ලියන්න.

i. ඝෝෂ අඝෝෂ ශබ්ද
ii. පූර්වනාසික්‍යජ (නාසිකීකෘත) ශබ්ද නිෂ්පාදනය
iii. ප්‍රාස්තාවික භාෂා ලක්ෂණ
iv. සිංහලයේ පරිමිත ව්‍යවහාර

(2 - 10 පිළිතුරුවලට ලකුණු 19 බැගිනි.)

*************************************